# සීගිරිය අවට සංචාරක කර්මාන්තය සඳහා යොදාගන්නා හස්තීන් පිළිබඳ විමර්ශනයක්

**පී.ආර්. අසංක බුද්ධික සිරි ***

ලෝක උරුම වටිනාකමක් ඇති සීගිරිය වර්තමානය වන විට දෙස් විදෙස් සංචාරකයන්ගේ පාරාදීසයක් බඳුය. මන්ද අද වන විට සීගිරිය නැරඹීමට පැමිණෙන විදේශීය සංචාරකයන්ගේ හිමිවන දෛනික ආදායම කෝටි තුනක් ඉක්මවා ගොස් ඇත. එවැනි ලෝක උරුම වටිනාකමක් ඇති සීගිරිය අවට සංචාරකයින් සඳහා ක්‍රියාත්මක වන්නා වූ ක්‍රියාකාරකම් අතර අලි සෆාරි ප්‍රමුඛතාවයක් ගනු ලැබේ. ඒ අනුව සීගිරිය අවට ප්‍රධාන වශයෙන් ලේක් විව් සහ ප්‍රිය සෆාරි යනුවෙන් අලි සෆාරි ආයතන දෙකක් පවතින අතර එය විදේශීය සංචාරකයන්ගේ වැඩි අවධානයක් යොමු වී ඇත. මෙහිදී ලේක් විව් සෆාරි ආයතනය සීගිරි වැව සමීපයේ පිහිටා ඇති අතර ඔවුන් මේ සඳහා එක් හස්තියෙකු යොදා ගනිමින් මෙම කර්මාන්තය පවත්වා ගෙන යනු ලැබේ. මෙම හස්තිය මුතියංගන රජමහා විහාරයට අයත් බවත්, පිය රංජන නැමැත්තා මාසිකව රුපියල් ලක්ෂ දෙකක් වැනි මුදලක් මේ සඳහා ගෙවනු ලැබේ. මුතු නමින් හැඳින්වෙන මෙම හස්තියා අඩි 7 1/2 පමණ උසකින් යුක්ත වන අතර වයස අවු 29 කි. දිනකට සංචාරක ගමන් වාර හතක් පමණ ගෙන යනු ලබන අතර මෙහිදී එක් සංචාරකයෙකු ගෙන් රුපියල් 1000 ක් වැනි මුදලක් අය කෙරේ. මෙහිදී දහවල් කාලයේදී පැය තුනකට අධික කාලයක් හස්තියාත් ඔයේ බස්සවා නාවනු ලබන අතර ආහාරය සඳහා දිනකට කිලෝ ග්‍රෑම් 300 අධික ආහාර ප්‍රමාණයෙන් ලබාදේ. විශේෂයෙන්ම ආහාර අතර බහුල වශයෙන් පොල් අතු ලබාදෙන අතර කිතුල් කොට හා කොස් අතු ද ලබාදේ. එමෙන්ම ප්‍රිය අලි සෆාරි යටතේ හස්තීන් දෙන්නෙකු සිටින අතර දැනට ඇතින්නක් පමණක් සංචාරක ගමනාන්ත සඳහා යොදා ගැනේ.

ශ්‍රී ලංකාවේ වැඩිම හස්තීන් සංඛ්‍යාවක් සිටින අලි රොෂාන් නැමති පුද්ගලයාට අයත් හස්තීන් මෙම ස්ථානයේ සිටින අතර මසකට රුපියක් එක් ලක්ෂ පනස්දහසකට අධික මුදලක් හස්තියෙකට ගෙවෙනු ලැබේ. සීතා නමින් හඳුන්වන මෙම හස්තියා අඩි අටක් පමණ උසකින් යුක්ත වන අතර වයස අවු 45 ක් වේ. මෙම සෆාරි ආයතන දෙකේ සිටින හස්තීන් ඉතාමත් නිරෝගී තරුණවියේ පසුවන හස්තීන් වුව ද හස්තීන්ගේ සනීපාරක්ෂක හා නඩත්තු කටයුතු ප්‍රමාණවත් නොවන අතර මේ නිසා හස්තීන් වෙනුවෙන් සිදු කළ යුතු පුද සත්කාර නිසි අයුරින් සිදු නොවේ. දිනකට සංචාරකයින්ගෙන් රු 40000 පමණ ආදායමක් හිමිවූ නමුත් හස්තීන්ට ආහාරය සඳහා ලබාදෙන්නේ පොල් අතු පමණි. එමෙන්ම හස්තීන්ව ගාල් කරනු ලබන ස්ථාන ද යහපත් තත්ත්වයක නොමැති බව පෙනේ. මේ හේතුවෙන් මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ සංචාරක කර්මාන්තය සඳහා යොදාගන්නා මෙම හස්තීන්ගේ පැවැත්ම, ආරක්ෂාව, සනීපාරක්ෂාව හා ආහාර පාන හා සම්බන්ධ කරුණු පිළිබඳ අවධානය යොමු කිරීම හා විශාල සංචාරක පිරිසක් ඇදී එන ලෝක උරුම ස්ථානයක් වන සීගිරිය ආශ්‍රිත මෙම ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයට යොදාගන්නා හස්තීන්ගේ පැවැත්ම සම්බන්ධ සැලකිලිමත් බුහුතරයගේ යුතුකමකි.

**ප්‍රමුඛ පද - හස්තීයා, අලි සෆාරි, සීගිරිය, සංචාරක**

*** පර්යේෂණ නිලධාරී (කැණීම් අංශය), මධ්‍යම සංස්කෘතික අරමුදල, සීගිරිය ව්‍යාපෘතිය, සීගිරිය.**